# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## උසස් අධ්‍යාපනයේ නියමුවකු ලෙස එක් වන්න

## අයදුම්පත් කැඳවීමයි

# උපකුලපති තනතුර

වර්ෂ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34 (1) වගන්තිය සහ අනතුරුව සිදු කළ සංශෝධනයන් සහ කොමිසමේ චක්‍රලේඛ අංක 03/2023 ප්‍රකාරව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයීය පාලක සභාව මඟින් උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

වර්ෂ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උපකුලපතිවරයා පූර්ණ කාලීන නිලධරයකු වන අතරම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරියා, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ද වන්නේය, ඔහු / ඇය නිල බලයෙන්ම පාලක සභාවේ සහ සනාථන සභාවේ සාමාජිකයකු සහ සභාපති ද වන්නේය.

ඔහු/ඇය කල් ඇතිව තනතුර අත්හළහොත් හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව තනතුරින් ඉවත් කරනු ලැබුවහොත් හෝ නොවන්නේ නම් වසර තුනක කාලයක් හෝ ඔහු/ඇයගේ වයස අවුරුදු හැටපහ සම්පූර්ණ වන දිනය යන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා තනතුර දැරිය යුතුය.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති පවත්වාගැනීම සහ හඳුන්වාදීම, පාලක සභාවේ තීරණයන් ක්‍රියාත්මක කිරීම සහ සාමාන්‍ය පරිපාලනය මෙහෙයවීම පිළිබඳව උපකුලපතිවරයා වගකිව යුතුය. ඔහු/ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගකිවයුතු බව ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ ඵලදායි අපක්ෂපාතී නායකත්ව මූලධර්මයන් සුරැකිය යුතුය.

සාර්ථක අයදුම්කරු සතුව පුළුල් පර්යේෂණ පරිචයක්, විශිෂ්ට නායකත්ව ලක්ෂණයන් සහ විවිධ පුද්ගල කාණ්ඩායම් සමග සාර්ථකව කටයුතු කළ හැකි අන්තර් පුද්ගල පෞරුෂයක්, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ තීරණයන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාව ද, ඇතුළුව ඉහළ අධ්‍යයන සුදුසුකම් සපුරාලිය යුතුය. ඔහු / ඇය සතුව ප්‍රජාව සඳහා කැපවීම ද ඇතුළුව විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්ති සහ විශ්වවිද්‍යාලයේ මෙහෙවර පිළිබඳව ද ගැඹුරු අවබෝධයක් ද තිබිය යුතුය. (පහත දැක්වෙන විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන ://www.rjt.ac.lk/news/?cat=2 මඟින් වැඩිදුර තොරතුරු අදාළ අයදුම්කරුවන්ට / නම් කළ අයට ආයාචනා කෙරේ.)

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තිබෙන ඉහළම අධ්‍යයන වැටුපද, මූලික වැටුපෙන් 15%ක සංග්‍රහ දීමනාවක්ද, සන්නිවේදන දීමනාවක්ද, ඉන්ධන දීමනාවක් ආදියද, සඳහා උපකුලපතිවරයාට හිමිකම ලැබේ. ඊට අතිරේකව රියැදුරකු සහිතව රාජකාරී වාහනයක් සහ උපකුලපතිවරුන්ගේ නිවාස ක්‍රමයෙහි තිබෙන සියලු පහසුකම් සහ සේවාවන් සහිත නිවසක්ද, ලැබීමට උපකුලපතිට හිමිකම තිබේ.

**අයදුම්පත සමග පහත දැක්වෙන ලේඛන ද එවිය යුතුය.**

I. උපන් දිනය ද සහිත අයදුම්කරුගේ සම්පූර්ණ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ලේඛන

II. විශ්වවිද්‍යාලයේ සංවර්ධනය උදෙසා දැක්ම පිළිබඳ පුද්ගලික ප්‍රකාශනයක් සහ උපකුලපති තනතුරට පත් කරනු ලැබුවහොත් අයදුම්කරු විසින් ළඟා කරගැනීමට අපේක්ෂිත ජයග්‍රහණ සම්බන්ධව කෙටි හැඳින්වීමක්.

III. දැනට උපකුලපති තනතුරෙහි කටයුතු කරනු ලබන හෝ මීන් පෙර මෙම විශ්වවිද්‍යාලයේ එම තනතුර හෙබවූ අයෙක් නම්, ඉහත සඳහන් (II ඡේදය) ලේඛනවලට අමතරව තමන් දැරූ මුල් සේවා කාලය තුළ ඔහු / ඇය විසින් ලබාගත් ජයග්‍රහණ මතු කොට දක්වමින් වාර්තාවක් ලබාදිය යුතුය.

IV. රාජ්‍ය සේවයේ, සංස්ථාවල, ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය නොවන උසස් අධ්‍යාපන ආයතනයක සේවයේ නියුතුව සිටින අයදුම්කරුවන් විසින්, තම සේවායෝජක වෙතින්, අයදුම්කරු මෙම තනතුරට තෝරාගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ සඳහන් කරමින් ලිපියක් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත්, ලේඛකාධිකාරී / පාලක සභා ලේකම්, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, ලේඛකාධිකාරී කාර්යාලය වෙත, ඕනෑම රාජකාරී දිනයකදී, 2024-07-23 දින ප.ව. 3.30ට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ "උපකුලපති තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

එයට අමතරව, අයදුම්පතෙහි හා අදාළ ලේඛනවල මෘදු පිටපතක් PDF ආකෘතියෙන්, ඉහත සඳහන් දිනයට පෙර, ඊමේල් ලිපිනය වන registrar@rjt.ac.lk වෙත යොමු කළ යුතුය.

අදාළ අයදුම්පත් භාර ගන්නා අවසන් දිනයට පසු මාස දෙකක් ඇතුළත රාජකාරී දිනයකදී, විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලබන අතර, අගැයුම් කිරීම හා සම්මුඛ පරීක්ෂණ සඳහා අයදුම්කරුවන්, පුද්ගලිකව, අදාළ විශේෂ පාලක සභා රැස්වීමට කැඳවනු ඇත. සියලුම අයදුම්කරුවන් විසින්, අවම විනාඩි දහයක (10) කාලයක කෙටි ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතු අතර, එම කාලය විනාඩි පහළොවක් (15) නොඉක්මවිය යුතුය. යම් අයදුම්කරුවකුහට, රෝගී තත්ත්වයක් හෝ විදේශගතවීමක් හේතුවෙන් අදාළ විශේෂ පාලක සභා රැස්වීමට සහභාගිවීමට නොහැකි වුවහොත්, ඔහු / ඇයහට වර්චුවල් මාධ්‍යයෙන් එයට සහභාගි විය හැකි අතර, ඒ බවට ලේකම් වෙත කලින් දැනුම් දීමක් සිදුකළ යුතුය.

අදාළ තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2023-04-10 දිනැති චක්‍රලේඛ අංක 03/2023 සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් සිදුකරනු ලැබේ. අදාළ උපකුලපති පත් කිරීම සම්බන්ධයෙන් වන ක්‍රමවේදය පිළිබඳව වැඩිදුර විස්තර සඳහා ඉහත සඳහන් චක්‍රලේඛය වෙත යොමු වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

අදාළ භාරගනු ලබන අවසන් දිනයට පසුව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී හා පාලක සභා ලේකම්,**

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.**

2024-06-23